පාර්ලිමේන්තුවේ පුස්තකාලය

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1978 අංක 8 දරන
# (පෞද්ගලික අංශයේ) අභ්‍යාසලාභීන් සේවයෙහි නියුක්ත කර ගැනීමේ පනත

---

[සහතිකය සටහන් කළේ 1978 නොවැම්බර් මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1978 දෙසැම්බර් මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 40 යි. නැපැල් ගාස්තුව : ශත 25 යි.

# 1978 අංක 8 දරන (පෞද්ගලික අංශයේ) අභ්‍යාසලාභීන් සේවයෙහි නියුක්ත කර ගැනීමේ පනත

[සහතිකය සටහන් කළේ 1078 නොවැම්බර් මස 24 වන දින]

එල්. ඩී.—ඕ. 52/78.

**පෞද්ගලික අංශයේ කම්කරුවන්ගේ සේවා නියුක්තයන්ට ඇතැම් නියම සහ කොන්දේසි මත නැතැන්නන් සමඟ පුහුණු වීමේ ගිවිසුම්වලට ඇතුළු වීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ගිවිසුම යටතේ පුහුණු වීමේ කාලසීමාව අවසානයේ දී අභ්‍යාසලාභීන්ට සේවා නියුක්තිය සහතික කිරීම පිණිස ද, එයට සම්බන්ධ කාරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1078 අංක 8 දරන (පෞද්ගලික අංශයේ) අභ්‍යාසලාභීන් සේවයෙහි නියුක්ත කර ගැනීමේ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 1078 මැයි 1 වන දින සිට එය ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය. *(කෙටි නාමය සහ ක්‍රියාත්මක වන දිනය.)*

2. ආධුනිකයන් පුහුණු කිරීම හෝ සේවයෙහි නියුක්ත කිරීම හෝ සඳහා වෙන යම් නීතියක ඇති වැඩ පිළිවෙලකට හානියක් නොමැතිව (මේ පනතෙහි මින් මතු "සේවායෝජක" යනුවෙන් සඳහන් කරනු ලබන) පෞද්ගලික අංශයේ කම්කරුවන්ගේ සේවා යෝජකයකු විසින් යම් අභ්‍යාසලාභියකු සමඟ, මේ පනතේ උපලේඛනයේ I වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් රක්ෂාවක ප්‍රායෝගික පුහුණුවක් ඒ අභ්‍යාසලාභියාට ලබා දීමේ කාර්යය සඳහා සේවා යෝජක විසින් තීරණය කරනු ලබන එක් අවුරුද්දකට නොවැඩි කාල සීමාවක් සඳහා වූ ද මේ පනතෙහි මින් මතු දැක්වෙන නියමයන් හා කොන්දේසි මත වූ ද පුහුණු වීමේ ගිවිසුමකට ඇතුළු විය හැකි ය. *(පුහුණු වීමේ ගිවිසුම්.)*

3. (1) අභ්‍යාසලාභියකු සමඟ 2 වන වගන්තිය යටතේ වූ පුහුණු වීමේ ගිවිසුමකට ඇතුළු වී සිටින සෑම සේවායෝජකයකු විසින් ම, මේ පනතේ උපලේඛනයේ I වන තීරයෙහි නිශ්චිතව සඳහන්, අභ්‍යාසලාභියා පුහුණු කරවනු ලබන රක්ෂාව සඳහා අදාළ වන, ඒ උපලේඛනයේ අනුරූප II වන තීරයෙහි නිශ්චිතව සඳහන් දීමනාව අභ්‍යාසලාභියා වෙත පුහුණු වීමේ කාලසීමාව තුළ දී ගෙවනු ලැබිය යුතු ය. *(අභ්‍යාසලාභියකුට ගෙවිය යුතු දීමනාව.)*

(2) (1) වන උපවගන්තිය යටතේ අභ්‍යාසලාභියකුට ගෙවනු ලැබිය යුතු දීමනාව හෝ 5 වන වගන්තිය යටතේ ඔහුට ගෙවනු ලැබිය හැකි දීමනාවක් හෝ හැර වෙන යම් වැටුපක්, වේතනයක් හෝ දීමනාවක් පුහුණු වීමේ කාලය තුළ දී ලබා ගැනීමට හිමිකමක් ඔහුට නොතිබිය යුතු ය.

2—ඒ 37273—12,280(78/10)

*අභ්‍යාස ලාභීන්ට සේවා නියුක්තිය සහතික කිරීම.*

9. පුහුණුවීමේ කාල සීමාව අවසානයේ දී සේවායෝජක විසින්, මේ පනතේ උපලේඛනයෙහි I වන තීරයෙහි නිශ්චිතව සඳහන් වූ ද, අභ්‍යාසලාභියා පුහුණු කරනු ලැබුවා වූ ද රක්ෂාවක සේවා නියුක්තිය අභ්‍යාසලාභියාට ලබා දිය යුතු ය; එසේ නැතහොත් විකල්ප වශයෙන් වෙනත් සුදුසු රැකියාවක් ඔහුට සොයා දිය යුතු ය.

*පුහුණුවීමේ ගිවිසුම අවසන් කිරීම.*

10. (1) සේවායෝජකයකු විසින්—

(අ) අභ්‍යාසලාභියා සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාවේ යෙදවීමේ දී; නැතහොත්

(ආ) අභ්‍යාසලාභියා පුහුණු කරනු ලබන්නේ යම් රක්ෂාවක සේවයේ නියුක්ත කර ගැනීම සඳහා ද, ඒ රක්ෂාව සඳහා අවශ්‍ය ප්‍රවීණතා තත්ත්වය ලබා ගැනීමට අභ්‍යාසලාභියා අපොහොසත් වී ඇති බව ඒ සේවා යෝජකයාගේ මතය වේ නම්, කම්කරු කොමසාරිස්වරයාගේ අවසරය ඇතිව,

මේ පනත යටතේ වූ පුහුණුවීමේ ගිවිසුමක් අවසන් කරනු ලැබිය හැකි ය.

(2) අභ්‍යාසලාභියා විසින්, සේවායෝජක වෙත දින තිහක දැන්වීමක් කිරීමෙන් පසුව හෝ දැන්වීම වෙනුවට ඊට පෙර මාසයේ දී ඔහුට ගෙවන ලද යම් දීමනාවක් ඇත් නම් ඒ දීමනාව ආපසු සේවායෝජක වෙත ගෙවීමෙන් හෝ පුහුණුවීමේ ගිවිසුම අවසන් කරනු ලැබිය හැකි ය.

*නියෝග.*

11. (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බල ගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් ම සහ (1) වන උපවගන්තියෙන් පිරිනමා ඇති බලතලවල ව්‍යාප්තතාවට හානියක් නොමැතිව, පහත සඳහන් සියලු කරුණු සම්බන්ධයෙන් හෝ එයින් යම් කරුණක් සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) අභ්‍යාසලාභීන් පිළිබඳ නාම ලේඛනයක් පිළියෙල කොට පවත්වා ගෙන යාම සහ සම්පූර්ණයෙන් එම නාම ලේඛනයෙහි හෝ ඉන් කොටසක හෝ පිටපත් ගැනීම;

(ආ) සේවායෝජකයන් විසින් වාර වාර්තා සකස් කර ඉදිරිපත් කිරීම සහ සම්පූර්ණයෙන් එම වාර්තාවක හෝ ඉන් යම් කොටසක හෝ පිටපත් ගැනීම;

(ඇ) පුහුණු වීමේ ගිවිසුමක නියමයන් සහ කොන්දේසි අනිසි ලෙස යොදා ගැනීම වැළැක්වීම; සහ

(ඈ) අභ්‍යාසලාභීන් පුහුණු කරනු ලබන ස්ථානවලට හෝ අභ්‍යාස ලාභීන්ට අදාළ නාම ලේඛන සහ වාර වාර්තා තබා ඇති ස්ථානවලට හෝ ඇතුළු වීමේ සහ එම ස්ථාන පරීක්ෂා කිරීමේ බලතල.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයේ දී හෝ ඒ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන යම් පසු දිනයක හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක්, එය යටතේ කලින් කරන ලද යම් දෙයකට හානියක් නොමැතිව, එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

වැරදි.

12. (1) මේ පනත යටතේ අභ්‍යාසලාභියකුට ගෙවිය යුතු යම් දීමනාවක් ගෙවීම පැහැර හරින්නා වූ හෝ 9 වන වගන්තියෙහි විධිවිධාන කඩ කරන්නා වූ හෝ සේවායෝජකයකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් දහසක් නො ඉක්මවන දඩයකට හෝ මාස හයක් නො ඉක්මවන කාලයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) අභ්‍යාසලාභියකුට යම් දීමනාවක් ගෙවීම පැහැර හැරීම සඳහා සේවායෝජකයකු (1) වන උපවගන්තිය යටතේ වරදකරුවකු කරනු ලබන අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයා විසින් එම වරද සඳහා නියම කරනු ලැබිය හැකි වෙන යම් දණ්ඩනයකට අමතරව, අභ්‍යාසලාභියාට දීමනාව වශයෙන් අයවිය යුතු මුදල ගෙවන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් සේවායෝජකට ආඥා කළ හැකි ය. තවද එම මුදල, සේවායෝජක විසින් ගෙවනු නොලැබුවහොත් මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරන ලද දඩයක් ලෙස අයකර ගනු ලැබිය හැකි අතර, එසේ අයකර ගනු ලැබූ පසු අභ්‍යාසලාභියාට ගෙවනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ වරදක් සඳහා නඩු පැවරීමක දී සේවායෝජකයකු විසින් පවත්වා ගෙන යන යම් නාම ලේඛනයක් හෝ සාදන ලද යම් වාර වාර්තාවක් සාක්ෂියේ දී ආවේශ්‍ය කළ හැකි වන අතර, එය එහි සඳහන් විස්තර සම්බන්ධයෙන් සේවායෝජකට විරුද්ධව බැලූ බැල්මට පෙනෙන සාක්ෂි විය යුතු ය.

පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි.

13. පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වූ වරදක් කරන ලද අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම් වරද කරන ලද අවස්ථාවේ ඒ මණ්ඩලයෙහි අධ්‍යක්ෂවරයකුව, ලේකම්වරයකුව හෝ වෙනත් එවැනි නිලධරයකුව සිටි සෑම තැනැත්තකු ම ; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නොවේ නම්, වරද කරන ලද අවස්ථාවේ ඒ මණ්ඩලයේ සාමාජිකයකුව සිටි සෑම තැනැත්තකු ම

ඒ වරද කරන ලද්දේ තමාගේ කැමැත්ත හෝ වංක සහයෝගය නොමැතිව බවත් ඔහුගේ කටයුතුවල ස්වභාවය සැලකිල්ලට ගෙන බලන විට හා අවස්ථානුගත කරුණු අනුව එම වරද කිරීම වැළැක්වීම පිණිස තමා විසින් කළ යුතුව තිබුණු පරිදි නිසි සියලු උද්‍යෝගයෙන් තමා ක්‍රියා කළ බවත් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

14. වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය. ඒ අනුව, මේ පනතේ විධිවිධාන සහ ඒ වෙනත් ලිඛිත නීතියේ විධිවිධාන අතර යම් ගැටීමක් හෝ අනනුකූලතාවක් හෝ ඇති වුවහොත්, මේ පනතේ විධිවිධාන ඒ වෙනත් ලිඛිත නීතිය අභිභවා බලපැවැත්විය යුතු ය. මේ පනත වෙනත් නීති අභිභවා බල පැවැත්විය යුතු බව.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"සාමූහික ගිවිසුම" යන්නට කාර්මික ආරාවුල් පනතෙහි ඇති අර්ථය ම තිබේ;

"කම්කරු කොමසාරිස්වරයා" යන්නෙන් කම්කරු කොමසාරිස් ධුරය තත් කාලයෙහි දරන තැනැත්තා අදහස් වන අතර, නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයෙක් හෝ සහකාර කම්කරු කොමසාරිස්වරයෙක් ද ඊට ඇතුළත් වේ;

"සේවායෝජක" යන්නට යම් සේවායෝජක මණ්ඩලයක් සංස්ථාවක් වුව ද නොවුව ද, ඒ සේවායෝජක මණ්ඩලය ඇතුළත් වේ;

"පැයක අනුපාතිකය" යන්නෙන් අවස්ථාවෝචිත පරිදි, අභ්‍යාසලාභියකුට ගෙවිය යුතු මාසික අනුපාතිකය 240 න් බෙදීමෙන් හෝ අභ්‍යාසලාභියකුට ගෙවිය යුතු දෛනික අනුපාතිකය 8 න් බෙදීමෙන් හෝ ලබා ගන්නා අනුපාතිකය අදහස් වේ;

"ලියාපදිංචි වෛද්‍යවරයා" යන්නෙන් වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචිවුණු වෛද්‍යවරයෙක් හෝ 1961 අංක 31 දරන ආයුර්වේද පනත යටතේ ලියාපදිංචි වූ ආයුර්වේද වෛද්‍යවරයෙක් හෝ අදහස් වේ; තවද

"අභ්‍යාසලාභියා" යන්නෙන් 2 වන වගන්තිය යටතේ සේවායෝජකයකු සමග පුහුණු වීමේ ගිවිසුමකට ඇතුළත් වූ තැනැත්තෙක් අදහස් වේ.

## උපලේඛනය

2 වන සහ 3 වන වගන්ති

| I වන තීරය | II වන තීරය |
|---|---|
| රක්ෂා | දීමනාව |
| 1. ලිපිකරුවන්, ලඝු ලේඛකයන්, පොත් තබන්නන්, යතුරු ලේඛකයන්, අධීක්ෂකයන්, වෙළෙඳාම් කරුවන්, සාප්පු සහායකයන්, ගබඩා භාර කරුවන්, දුරකථන ක්‍රියාකරවන්නන්, අයකැමියන්, වැඩ මූලිකයන් හෝ එවැනි වෙනත් රක්ෂාවක්. | මසකට රුපියල් දෙසිය හැත්තෑ පහක්. |
| 2. මුරකරුවන්, ආරක්ෂකයන්, බයිසිකල් පණිවිඩ කරුවන්, කාර්යාල කාර්ය සහායකයන්, සෝපාන ක්‍රියාකරවන්නන්, කාර්යාල සහ සාප්පු කම්කරුවන්, බාහිර පණිවිඩ කරුවන්, තේ පැන් ගෙනෙන්නන් හෝ වෙනත් එවැනි රක්ෂාවක්. | මසකට රුපියල් දෙසිය හතළිහක් හෝ ඔහු සේවයේ යොදවනු ලැබූ එක් එක් දිනකට රුපියල් දහයක්. |
| 3. ඉහත 1 වන සහ 2 වන විෂයයන් වල නිශ්චිතව සඳහන් රක්ෂාවක් නොවූ ද පඩි පාලක සභා ආඥාපනත යටතේ පඩි පාලක සභාවක් පිහිටුවනු ලැබ ඇත්තාවූ ද, කර්මාන්ත ශාලාවක හෝ යම් කර්මාන්තයක යම් රක්ෂාවක්. | මසකට රුපියල් එකසිය අසූවක් හෝ ඔහු සේවයේ යොදවනු ලැබූ එක් එක් දිනකට රුපියල් හයයි ශත පණහක්. |